# සිවුරු හැරීම වසන් කළ යුතු වරදක් ද?



Graphics - Shanalee

අමාරුවේ වැටෙන්නටත් ඉඩ ඇති මේ මාතෘකාව ගැන ලියන්නට මට හිතුණේ මෑතක කියවූ පුවත් තුනක් ගැන කල්පනා කරන විට ය. පළමුවැන්න මා දුටුවේ ඉරිදා පත්තරයක ය. එම පුවත්පතට නිතර ලියන ජනප්‍රිය ලේඛකයෙක් එක්තරා සරසවි ඇදුරකුගේ "හීරළු ගඳ" දැනුණු බව අවධාරණය කළේ ය. එය ලියා තිබුණේ අර සරසවි ඇදුරා කළ විවේචනයකට ප්‍රතිචාර වශයෙනි. විසි වතාවක් පමණ සිවුරු දරා සිවුරු හල කෙනකු ගැන කියවන්නට ලැබුණේ මෑත දී ය. පුද්ගලයා ජනප්‍රිය ධර්ම දේශකයකු වූ හාරිස්පත්තුවේ අරියවංසාලංකාර හාමුදුරුවෝ ය. තමන්ට මහණ වීමට අවශ්‍ය වුවත් දෙමාපිය සහෝදරාදීන්ගේ වැඩ කටයුතු නිමා කරන තෙක් එය පමා කළ බව පවසන උන් වහන්සේ ඒ තාක් කල් වසරකට මාසයක් පමණ සිවුරු දරාගෙන මහණ දම් පිරූ බව සඳහන් කරති. අවසන් වරට මහණ වූයේ අර වගකීම් සියල්ල හමාර කරලා ය.

උන් වහන්සේ සිවුරු හැරීම ගැන නිසි පිළිකුලක් දක්වන්නේ නැත . ඇත්ත වශයෙන්ම සමහර රටවල කාලයක් මහණව සිටීමේ පුරුද්ද ගැන සඳහන් කරන හාමුදුරුවෝ එම පරිපාටිය අනුමත කරති. මේ විස්තරය කියවන මට මතක් වූයේ ඔය අතරවාරයේ මා කියවූ එක් ලිපියකි. ශ්‍රී ජයවර්ධනපුර සරසවියෙන් විශ්‍රාම ලත් මහාචාර්ය විමල් බලගල්ල ගැන ලියවුණු ලිපියක්. ඔහුගේ පාණ්ඩිත්‍යය සහ සේවය ගැන විස්තර කරන එම ලිපියෙහි එක්තරා අඩුවක් ඇතැයි මා සිතුවේ ඒ කියන පාණ්ඩිත්‍යය අත්පත් කර ගැනීම ගැන කිසිවක් කීම මගහළ නිසා ය. බලගල්ලේ විමලබුද්ධි නමින් කලින් මා දැන සිටි ඔහු ප්‍රාචීන භාෂා විශාරදයකු බවට පත් වූයේ පැවිදි බිමේ සිටියදී බව දන්නා මම යම් හෙයකින් ගිහියකුව සිටියේ නම් ඔහු ඒ තැනට නොඑන්නට හොඳටම ඉඩ තිබුණ බව ද විශ්වාස කරමි. මට මතක් කළ හැකි තවත් එබන්දෝ වෙති. සිඩ්නිවාසී මහාචාර්යවරයකු වූ හේම එල්ලාවල කලින් එල්ලාවල හේමාරාම හාමුදුරුවෝ ය. මගේ ගුරුවරයකු වූ මහාචාර්ය එම් ශ්‍රී රම්මණ්ඩලත් පැවිදිව සිටි බව දනිතත් පැවිදි නම මට මතක නැත . ශ්‍රී ජයවර්ධනපුර සරසවියේම සිටි කාන්ගරආරච්චි ද කලින් පැවිදිව සිටියෙකැයි සිතමි. සූරියගොඩ සුමංගල නමින් සිටි පඬිවරයා උපැවිදි වීමෙන් පසු ලැබූ දරුවෝ දෙදෙනෙක් මගේ කාලයේ සරසවියේ සිටියහ.

ඒ දෙන්නාගෙන් එක් කෙනකු සිය පියා ගැන ඉංගිරිසි සඟරාවකට ලියූ ලිපියක් මට කියවන්නට ලැබුණේය. ඔහුගේ ප්‍රාචීන භාෂා පාණ්ඩිත්‍යය ගැන කියන දරුවා අර අතීතය සඳහන් නොකිරීම එක අතකින් තේරුම් ගත හැකි ය. එහෙත් අනෙක් අය මේ කරුණ වසන් කරන්නේ ඔවුනට ගරු කිරීමක් වශයෙන් ද යන ප්‍රශ්නය නැගිය යුතුය. මා කල්පනා කරන විදියට නම් ඔය කියන කිසිවකු

***<u>සිවුරේ ගත කළ දිවිය වසන් කරන්නට වජිර පැල්පිට කිසිවිටක කල්පනා නොකළේ ය. ඒ බව සනාථ කරන හොඳම නිදසුන වෘත්තිය සමිති නායකයකු වශයෙන් ජාතික ජේෂකර්ම සංස්ථාවේ වෘත්තීය සටනක් මෙහෙයවමින් ඔහු කළ ප්‍රකාශයකි.</u>***

පැවිදි නොවූයේ නම් ඔය කියන පාණ්ඩිත්‍යය නොලබන්නට හොඳටම ඉඩ තිබුණේ ය. එසේ කල එම වැදගත් යථාර්ථය නොකියන්නේ ඇයි?

හාරිස්පත්තුවේ හාමුදුරුවන් හැරෙන්නට තමා සිවුරු හළ බව කියන්නට පසුබට නොවූ තවත් කෙනෙක් වූහ. වජිර පැල්පිට නමින් දේශපාලනයට පිවිසි පුද්ගලයා මා හඳුනා ගන්නේ සමසමාජ වේදිකාවේ ජනප්‍රිය කථිකයකු වූ යටිදැරියේ වජිරබුද්ධි හිමියන් හැටියට ය. ඔහු සිවුරු හළ අළුත ද මට හමුවිය. ඒ දවස් වල නව දිවියට හැඩ ගැසෙමින් සිටි ඔහු දෙහිවල ගල්කිස්ස නාගරික මන්ත්‍රී සිරිල් කොලොන්නේ සමග ඉන්දියා-වේ සංචාරයක යෙදෙන්නට සැරසෙමින් සිටියේ ය. ඒ පෙරලා ගිහි දිවියට බැසීම සඳහා ඔහු ලැබූ පෙරහුරුව විය.

සිවුරේ ගත කළ දිවිය වසන් කරන්නට වජිර පැල්පිට කිසිවිටක කල්පනා නොකළේ ය. ඒ බව සනාථ කරන හොඳම නිදසුන වෘත්තිය සමිති නායකයකු වශයෙන් ජාතික ජේෂකර්ම සංස්ථාවේ වෘත්තීය සටනක් මෙහෙයවමින් ඔහු කළ ප්‍රකාශයකි. සභාපති ධුරය හෙබවූයේ දංගෙදර මහතා ය. වජිර සභාපතිට අභියෝග කරමින් කීවේ මෙසේ ය.

"මම දං ගෙදරවල් සිය ගණනක් පුරුදු මිනිහෙක්"

සිවුරු හළ පුද්ගලයන් වෙතින් පළවන කුලෑටි ගතිය මා හොඳින් දන්නේ මගේ පොඩි අයියා ඒ ගණයට අයත් වූ නිසා ය. දෙවතාවක්ම මහණ වුවත් එයට ඔරොත්තු දීමට අපොහොසත් වූ ඔහු ගිහියකු වශයෙන් විවාහ වී දරුමල්ලන් ද ඇති දැඩි කරමින් සාමාන්‍ය ජීවිතයක් ගත කළේ ය. එහෙත් අර පසුබෑම " කුලෑටි ගතිය " දිගටම පැවති බව මා සිහිපත් කරන්නේ සංවේගයෙනි. මගේ සහෝදරයා මුහුණ දුන් එම අපහසුතාවට සිවුරු හළ කිසිවකු පත් නොවිය යුතු බව ය මා විශ්වාස කරන්නේ. කොටින්ම ඔවුහු හීරළුවන් කියා හෙළා දැකිය යුතු මිනිස් කොටසක් නොවෙති.

මහණකු සිවුරු හරින්නේ ඇයි ද යන ප්‍රශ්නය ගැන සිත් යොමු කරනු වස් පුද්ගලයකු මහණ වන්නේ ඇයිද යන මූලික ප්‍රශ්නය නැගිය යුතු යයි සිතමි. මගේ අයියා මහණ වූයේ සිවුරට නොහොත් මහණකමට ආකර්ශනය වූ නිසා ය. සිවුරු හැරියේ රාජකාරිය බරපතල බව වටහා ගත් පසුව ය. මා දන්නා තරමින් බොහෝ දෙනා මහණ වන්නේ ඒ වාගේ හරි හැටි අවබෝධයක් නැති අවදියක ය.

"මේ කසාව වස්ත්‍රය රැගෙන මා පැවිදි කරවනු මැනැවැ" යි ගුරු හාමුදුරු-වන්ගෙන් අයැද සිටින ආධුනිකයන් අතුරින් කීයෙන් කී දෙනෙක් තමන් උදච්චාරණය කරන වාක්‍යයේ බැරෑරුම් කම අවබෝධ කරගෙන එසේ කරන්නෝ ද?

අම්හිරි වුවත් මෙම ප්‍රශ්නය ඇසිය යුතු ය. එපමණක් නොවේ. කුඩා දරුවකු මහණ කරන වැඩිහිටියන් ඒ ප්‍රශ්නයට පිළිතුරු දිය යුතු බවත් කිව යුතු ය.

තමන්ට නොතේරෙන බරපතල රාජකාරිය-ක් කරට ගත් පුද්ගලයා ඒ කාරිය දැරිය නොහැකි බව වටහා ගැනීමත් ඒ නිසා ඒ වගකීමෙන් නිදහස් වීමත් අවශ්‍යයෙන්ම සිදුවිය යුත්තකි. එම පියවර නොහොත් ක්‍රියාව අවඥාවට පාත්‍ර වන වාතාවරණයක් ඇති වූයේ කෙසේ ද යන්නද විමසා බැලිය යුතු යයි සිතමි.

පැවිදි වීමේ තවත් විශේෂ අරමුණු ඇති බවද අපි දනිමු. පැහැදිලි අරමුණක් වනුයේ පන්සලේ දේපළ පරම්පරාවෙන් පිටට යාම වැළැක්වීම ය. ඒ අරමුණින් සිවුරු දරන්නට තීරණය කරන්නා වෙතින් පැවිද්දෙන් අපේක්ෂා කරන චරියාව පෙනී නොයාමද අරුමයක් විය නොහැකි ය. ඉගෙනීමට ලද හැකි අවසර නොහොත් පහසුකම් පතා පැවිදි වීම ද විරල වශයෙන් හෝ තිබිය හැකි ය. එසේ පැවිදි වන්නා තම අරමුණ ඉටුකර ගැනීමෙන් පසු පැවිදි බිමෙන් ඉවත් වීමේ වරදක් මට නම් නොපෙනෙයි. අකැමැත්තෙන් එහි රැඳී සිටීමෙන් ඔහු සසුනට හානියක් කරන්නට ඉඩ ඇති හෙයිනි.

උපැවිදි වීමට හේතුවන තවත් වැදගත් කරුණක් වනුයේ තරුණ භික්ෂුවකගේ සිත තරුණියක කෙරේ තදින් බැඳී යාම ය. ප්‍රකට පඬිවරයකු වූ භික්ෂුවක් පිඩු සිඟා යන අතර පාත්තරය ඔස්සේ ගනු දෙනු වූ පෙම් හසුන් ගණනාවකින් පසු එම සැදැහැවත් දායිකාව විවාහ කරගත් කතාවක් මා අසා ඇත . එය වුවත් අවසාන ප්‍රතිඵලය ගැන සලකන විට අහිතකරයයි කිව නොහැකි ය. අනෙක් අතට ගැහැනියක සමග සබඳතා පැවැත්වීමට අවශ්‍ය නම් සිවුරේ සිට එය කරනවාට වඩා එයින් ඉවත් වී ඒ කාර්යයයේ යෙදීම ද අගය කළ යුතු පියවරකි.

අපේ ගම් වල සිවුරු හළ පුද්ගලයා හඳුන්වන්නට නම් දෙකක් තිබුණේ ය. මූණට නොකියන අවඥා සහගත නාමය හීරළුවා ය. නම්බුකාර විදියට කතා කිරීමේදී යොදා ගන්නේ උපාසක උන්නැහේ නො-හොත් "උපාසකයා යන්න ය.

සව් සත් දම් වාදයට වේදිකාව සැපයූ " ලක්මිණිපහනේ" කතුවරයා වූ කොග්ගල ගුරුන්නා-




න්සේ කලින් කොග්ගල ධම්මතිලක නමින් පැවිදිව සිටි පුද්ගලයා ය. එම වාදයට අයත් ලිපි පළ කළ අනෙක් ප්‍රකාශනය වූ "යතලබ" සඟරාවේ කතුවරයා වූ බටුවන්තුඩාවේ පඬිවරයාද බටුවන්තුඩාවේ දේවරක්ෂිත නමින් පැවිදිව සිටි බව පෙනෙයි. එපමණක් නොවේ එවක සිටි බොහෝ පඬිවරු මෙම පැවිදි පසුබිමෙන් ආ බව ද පෙනෙයි. ඒ අතින් එම කරුණ ඍජුව පිළිගැනීමට තරම් එවක සිටි විද්වතුන් සිවුරු හළවුන්ට ගරු කළ බවක් ද පෙනෙයි. 1867 අප්‍රියෙල් 02 වැනි දින අභාවප්‍රාප්ත වූ කොග්ගල ගුරුන්නාන්සේ ගැන ලියූ "ලක්රිවි කිරණ" පුවත්පත ඔහු කලක් පැවිදිව සිට ශ්‍රමණභාවය අත් හළ බව කෙළින්ම ප්‍රකාශ කරයි. එසේ වු ද "සව්සත් වාදය" උග්‍රව තිබියදී අර මුලින් සඳහන් කළ "හීරළු ගඳ" කතාව බඳු කියුම් මගින් ප්‍රතිවාදීන්ට පහර එල්ල කිරීමද වරින් වර දක්නට ලැබුණු බව පෙනෙයි. "ඉබේම කොහොමද පඬි නම ගත්තේ ලජ්ජා නැති හීරළු රාලේ" යනුවෙන් කියැ-වෙන කවක් ශාස්ත්‍රාලංකාර සඟරාවේ පළ වූ බව සඳහන් වෙයි.

මේ ලිපිය ලියා හමාර කිරීමට පෙර "සිළුමිණ" පත්තරයෙට් පළ වූ සංවාදයකට සහභාගි වූයේ පණ්ඩිත අශෝක කරුණාරත්න ය. ඔහු වූ කලී වයස 24 වන විට ප්‍රාචීන පණ්ඩිත විභාගයෙන් සමත් වූ ඉන් වසර කිහිපයකට පසු "සාහිත්‍ය විවේචනය" නමින් අදත් ජනප්‍රියව පවතින ග්‍රන්ථය සම්පාදනය කළ විද්වතෙකි. සිංහල පාලි සංස්කෘත පමණක් නොව හින්දි බස ද උගත් ඔහු එම භාෂා ඥානය ලැබීමට සමත් වූයේ පැවිදි බිමේ සිටිය දී ය. අර පිළිසඳරෙහි ලා ඔහු මෙම අතීතය අනාවරණය කළේ සිය කැමැත්තෙන්ම ය. ඔහුට ඒ ආත්ම ශක්තිය තිබීම ද අගය කළ යුතු ය.

---

## ස්තුතියි

මගේ පියාගේ අභාවය වෙනුවෙන් පැමිණ සහ දුරකතනයෙන් ශෝකය පළ කළ සැමටත් අවමංගල්‍යයට සහභාගි වූ සැමටත් මල් වඩම් හා ශෝක ප්‍රකාශ එවූ සැමටත් නන් අයුරින් ආධාර කළ සැමටත් උතුරු වික්ටෝරියා ශ්‍රී ලාංකික සුබසාධක සංගමයේ සැමටත් මගේ සහ මගේ පවුලේ සැමගේ ස්තුතිය මෙයින් පුද කරමි

**තිලකා ගම්ලත්**
ඕක්පාක්